# මොණරාගල ප්‍රාදේශීය සභාව

## මොණරාගල දිස්ත්‍රික්කය

--------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 27 වැනි දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 02 දින විගණනයට ඉදිරිපත් කර තිබු අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 ජූලි 10 වැනි දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 **මතය**

----------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට මොනරාගල ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 <u>**මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**</u>

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) දිවි නැගුම දෙපාර්තමේන්තුවෙන් සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් 17 දින ලබා දී තිබු Laksteel වර්ගයේ ගැල්වනයිස් බට 824 ක වටිනාකම වූ රු. 912,285 ක් ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක අරමුදල වෙනුවෙන් ගෙවිය යුතු රු. 2,697,630 ක් වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට පරිග්‍රහණ ලේඛනය අනුව පුස්තකාල පොත්වල වටිනාකම රු. 1,169,802 ක් වුවද, රු. 947,955 ක් ලෙස රු. 221,847 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

1.3.2 **<u>ගෙවිය යුතු ගිණුම්</u>**

1989 හා 1990 යන වර්ෂ තුල නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉදිකර සභාවට ලබාදී තිබූ කඩ කාමර වෙනුවෙන් ගෙවිය යුතු රු. 4,872,912 ක මුදල නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

1.3.3 **<u>විගණනය සඳහා සාක්ෂි නොවීම.</u>**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 49,360,244 ක වත්කම් විෂයයන් 05 ක්, රු. 5,590,339 ක වගකීම් විෂයයන් 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණ කිරීමට නොහැකිවිය.

1.3.4 **<u>නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.</u>**

පහත දැක්වෙන නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) **<u>ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි</u>** | |
| 571 (3) | රු. 5,590,339 ක කල් ඉකුත් වූ තැන්පත් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) **<u>ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය</u>** | |
| XXIV පරිච්ඡේදයේ 1.6 හා 4 වගන්තිය. | සභාවේ සේවය කර, සේවය හැර ගිය, විශ්‍රාමගිය, මිය ගිය, නිලධාරීන් 34 දෙනෙකුගෙන් අයකර ගත යුතු රු.412,998 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 02. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 15,709,693 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන වියදමඉක්ම වූ ආදායම රු. 5,547,735 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ වැඩිවීම රු. 10,161,958 ක් විය.

### 2.2 <u>ආදායම් පරිපාලනය</u>

#### 2.2.1 <u>හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.47,446,384 ක් වූ හිග ආදායම් අයකර ගෙන නොතිබුණි.

#### 2.2.2 <u>බදු කුලී</u>

(අ) 2013 වර්ෂය සඳහා අංක 24 දරන ගවමස් කඩය බදු දීමෙන් ආරක්ෂිත ඇප තැන්පත් වශයෙන් ලැබිය යුතු රු.165,955 ක්ද, හිඟ බදුකුලී රු.1,107,132ක්ද හා ප්‍රමාද ගාස්තු රු.2,992,961 ක්ද, ඇතුළුව රු.4,266,048ක මුදලක් අයකරගැනිමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2010 වර්ෂය සඳහා අංක 24 දරන ගවමස් කඩය බදු ගත් බදුකරුගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.178,613 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉදිකර සභාවට භාර දී තිබූ කඩ කාමර 55 න් කඩ කාමර 14 ක් සඳහා ගිවිසුම් ප්‍රකාරව එකවර ගෙවිය යුතු මූලික තැන්පත් මුදල් රු. 2,106,875 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සභාව සතු දේපල තුනකින් පසුගිය වර්ෂ කිහිපයක් තුල අවස්ථා කිහිපයකදී බදු දිමට ටෙන්ඩර් කැඳවා තිබුණද ටෙන්ඩර් ඉදිරිපත් නොවිම නිසා රු. 2,282,914ක ආදායමක් අයකර ගැනීමට නොහැකි වී ඇත. මෙසේ බදුකරුවන් ඉදිරිපත් නොවන දේපල බදු දීමට සභාව විසින් විකල්ප ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි.

2.2.3 සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු

-------------------------------

සභා බල ප්‍රදේශයේ විවිධ සමාගම් විසින් 2005 සිට 2012 වර්ෂය දක්වා ඉදිකර තිබූ සම්ප්‍රේෂණ කුළුණු 12කින් වාර්ෂික බද්දක් අය කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

2.2.4 **වෙනත් ආදායම්**

------------------

(අ) 2012 ,2013 හා 2014 වර්ෂවලදී මෝටර් ග්‍රේඩරය බාහිර පුද්ගලයන් දහ දෙනෙකු වෙත කුලී පදනම මත සේවා සැපයීම වෙනුවෙන් අයවිය යුතු රු.206,263 ක මුදලක් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ විධිවිධාන අනුව ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ ලියාපදිංචි කර ඇති හෝ අනුමතකර ඇති හෝටල් ලැගුම්හල් වලින් අදාළ වර්ෂයට පෙර වර්ෂයේ ලැබීම් වලින් සියයට එක නොඉක්මවන ගාස්තුවක් අතුරු ව්‍යවස්ථා පනවා පළාත් පාලන ආයතන විසින් අයකර ගත යුතු වුවද සභා බල ප්‍රදේශයේ තිබෙන හෝටල්/ ලැගුම්හල් තුනකින් එසේ ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 1,131,182 |
| මුද්දර ගාස්තු | 2,416,692 |

2.3 <u>අධිභාර</u>

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේවිධි විධාන ප්‍රකාරව වගකිව යුතු අයවළුන්ට එරෙහිව මා විසින් ඉකුත් වර්ෂයන් තුළදී පනවන ලද අධිභාර සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.922,195 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

03. **මෙහෙයුම් සමාලෝචනය**
**-------------------------**

**මෙහෙයුම් අකාර්යක්ෂමතා**
**-------------------------------**

පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් රු. 220,800 ක් වටිනා ලීටර් 20 ප්ලාස්ටික් කසල බඳුන් 800 ක් 2013 වර්ෂයේදි සභාවට ලබාදී තිබුණි. මෙම කසල බඳුන් බෙදා හැරීමට කටයුතු නොකර 2015 මැයි 22 දින වන විටත් ගබඩාවෙහි ගබඩා කර තිබුණි

04. **<u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර පාලනය
(ඇ) ආදායම් පරිපාලනය